**බුත්තල ප්‍රාදේශීය සභාව**
**මොණරාගල දිස්ත්‍රික්කය**
**-------------------------**

1. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 **<u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 02 වැනි දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 වැනි දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 අගෝස්තු 27 වන දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 **<u>මතය</u>**

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට බුත්තල ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

1.3.1 **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ඔක්කම්පිටිය මහජන පුස්තකාලයට පරිත්‍යාග වශයෙන් ලැබුණු පොත් 39 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.250,000 ක ප්‍රාග්ධන ආධාර ලැබිය

යුතු ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව විවිධ වියදම් සඳහා ගෙවිය යුතු රු.26,488 ක් සඳහා ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ බිල්කල වරිපනම් හා අක්කර බදු ආදායම රු.2,208,634 ක් වුවද එය රු.2,161,755 ක් වශයෙන් ගිණුම් ගත කිරීමෙන් රු.46,879 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට දේශිය ණය හා සංවර්ධන අරමුදලේ ණය ශේෂය රු.21,332,939 ක් වුවද, එය රු.19,580,471 ක් ලෙස සලකා ගිණුම් ගත කිරීමෙන් රු.1,752,468 ක් අඩුවෙන් ගිණුම් ගත වී තිබුණි.

(ඊ) දේශිය ණය හා සංවර්ධන අරමුදල සඳහා සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු පොළිය රු. 309,057 ක් වුවද, එය රු.801,760 ක් සේ සලකා ගිණුම් ගත කිරීමෙන් රු. 492,703 ක් වැඩිපුර ගිණුම් ගතකර තිබුණි.

1.3.2 **<u>නොසැසඳු පාලන ගිණුම්</u>**

ගිණුම් විෂයන් 03 කට අදාළව මූල්‍ය ප්‍රකාශණ අනුව ශේෂයන්ගේ එකතුව රු.20,161,706 ක් වූ අතර උපයෝගි ලේඛන අනුව ශේෂය 15,872,788 ක් විය.

1.3.3 **<u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>**

(අ) සමාලෝචිත වර්ෂයේ මෝටර් ග්‍රේඩරය, මාර්ග තලනය, බැකෝ ලෝඩරය හා ටිපර් රථ කුලියට දීමෙන් සභාවට අයවිය යුතුව තිබූ රු.6,702,008 ක් අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

(ආ) වර්ෂ ගණනාවක සිට ඉදිරියට එමින් පවතින රු.327,798 ක හිඟ පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුලදීද ක්‍රියාකර නොතිබුණි.

(ඇ) වර්ෂ ගණනාවක සිට ඉදිරියට එමින් පවතින රු.1,978,468 ක ණයහිමි ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුලදීද ක්‍රියාකර නොතිබුණි.

1.3.4 **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.381,000,165 ක් වූ වත්කම් විෂයන් 02 ක් හා රු.26,528,148 ක් වූ වගකීම් විෂයන් 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 **<u>නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.</u>**

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසි විධි විධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති,රීති රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | |
| | i 49 වගන්තිය | සැලසුම් කමිටුවේ අනුමැතියකින් තොරව පැල්වත්ත සීනි සමාගම් පරිශ්‍රයේ සම්ප්‍රේෂණ කුළුණු 04 ක් මොබිටෙල් සමාගම විසින් ඉදිකර තිබුණි. |
| | ii. 158 හා 159 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.18,451,167 ක් වූ හිඟ ආදායම් අයකර ගෙන නොතිබුණි. |

(ආ) **ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි**

| | |
|---|---|
| අංක 237 | සභාව විසින් විවිධ කාර්යයන් සිදුකිරීම සඳහා රු.65,460 ක් වියදම් කර මිලදී ගෙන තිබූ ද්‍රව්‍ය හා උපකරණ සම්බන්ධයෙන් තොග සහතික ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 10,363,126 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 10,393,801 ක් විය.

### 2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 1,821,552 |
| මුද්දර ගාස්තු | 702,332 |

### 2.3 අධිභාර

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(3) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවළුන්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයන් තුළදී පනවන ලද අධිභාර සම්බන්ධයෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු.733,241 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

## 3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

3.1 ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ස්ථාන 04 ක 2009 සිට 2013 කාල පරිච්ඡේදය තුළදි විවිධ දුරකථන සමාගම් මඟින් අනුමැතියකින් තොරව ඉදිකර තිබුසම්ප්‍රේෂණ කුළුණු 04 ක් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 52 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි

## 3.2 අවිධිමත් ගනුදෙනු

(අ) සමාලෝචිත වර්ෂයේ දී සභා කැබ් රථය අලුත්වැඩියාවට යවා තිබූ අවස්ථා වලදී කුලී පදනම මත පෞද්ගලික වාහන 03 ක් සභාවේ රාජකාරී සඳහා ධාවනයට යොදා ගෙන ඒ වෙනුවෙන් රු.559,628 ක් ගෙවා තිබුණද ඒ සඳහා පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) සභාව විසින් අවස්ථා 03 කදී රු. 884,730 ක් ගෙවා වාහන අලුත්වැඩියා කර තිබූ නමුත්, අලුත්වැඩියා කිරීමට පෙර දිසා යාන්ත්‍රික ඉංජිනේරුගේ නිර්දේශයන් ලබාගෙන නොතිබුණි.

## 3.3 මතභේදයට තුඩු දුන් ගණුදෙනු

(අ) බුත්තල බස් නැවතුම්පලෙහි 2012 දෙසැම්බර් 04 දින සිට 2013 ජුලි 05 දින දක්වා විදුලි පරිභෝජනය වෙනුවෙන් රු. 190,792 ක් ගෙවා තිබූ අතර එම කාල පරිච්ඡේදය තුල බස් නැවතුම්පලෙහි අසාමාන්‍ය විදුලි පාරිභෝජනයක් පෙන්නුම් කර තිබුණ ද. ඒ සම්බන්ධයෙන් හේතු ොසායා බලා නොතිබුණි

(ආ) 2011 වර්ෂයේ දී මාලිගාවිල හා රහතන්ගම ජල ව්‍යාපෘතිය යටතේ ජල සම්බන්ධතා ගාස්තු වශයෙන් ජල පාරිභෝගිකයින් 720 දෙනෙකුගෙන් රු. 1,221,500 ක් සභාවට අයකරගෙන තිබූ අතර, 2013 නොවැම්බර් 26 වන දින වන විටත් එම මුදල් පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණි. එසේ වුවද, මෙම ජල සම්බන්ධතාවය ලබාදීම වෙනුවෙන් ප්ලෑන් ශ්‍රී ලංකා ආයතනය මඟින් සභාවට අවස්ථා දෙකකදී රු.1,150,000 ක මුදලක් ලැබී තිබූ අතර, එම මුදලින් රු.200,000 ක් පාරිභෝගිකයින් 23 කුට ආපසු ගෙවා තිබුණි. ඒ අනුව අයකල මුදල් සභා ආදායමට නොගැනීමට හා පාරිභෝගිකයින් 23 කුට පමණක් ගාස්තු ආපසු ගෙවීමට හේතු විගණනයට අනාවරණය නොවීය

## 3.4 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

සභාව සතු පාවිච්චියට ගත නොහැකි 49-1966 මිනි ට්‍රැක්ටරය හා 53 -5078 දරන ට්‍රැක්ටරය අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 4 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් පිළියෙල කර තිබූ අයවැය ලේඛනය මඟින් ඇස්තමේන්තු කළ ආදායම්, වියදම් හා වර්ෂයේ තථ්‍ය ආදායම්, වියදම් අතර පෙන්නුම් කෙරෙන සැලකිය යුතු විචලනයක් අනුව ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය